# නාමල්ට මාව අමතක වේද කියන දුකක් මගේ සිතේ තිබුණා

**- රුවන්ති මංගලා**



### ඔබ දෙපළට විවාහ ජීවිතය දැනෙන්නේ මොනවගේ ද?

අපේ නිවෙසේ දී මට උදේ තේ එක ගෙනැත් දෙන්නේ අම්මා. ඒ විදියට හිටිය මට ඒත් විවාහයෙන් පස්සේ ජීවිතයේ මේ තරම් බරපතළ සිදුවීම්වලට මුහුණ දෙන්න වේවි කියලා. ඒ දවස්වල හීනෙකින්වත් සිතුණේ නැහැ. ඒ සමානවම වගකීම් රැසකුත් මා මතම පැටවුණා. ඒ දේවල් දෙස බලන කොට මේ දේවල් කළේ කොහොම ද කියන එක ගැන මට පුදුමයක් ඇති වෙනවා.



### කාගෙත් සිහින කුමාරයා වුණු නාමල්ට රසික - රසිකාවියන්ගෙන් ලැබෙන ප්‍රතිචාර ඔබට දරා ගන්න පුළුවන් වුණා ද?

ඒ කාලයේ ඒ ප්‍රතිචාර ලේසියෙන් දාරා ගන්න පුළුවන්කමක් මට තිබුණේ නැහැ. සිත කියන එක දන්නවනේ. විවාහයට කලින් සමහර අය නාමල්ව සොයාගෙන අපේ ගෙදරටත් ආවා. ඒ එන සමහර අය එන්නේ නාමල්ට පිස්සු වැටිලා වගේ. ඒ අයගෙන් සමහරු නාමල්ට කොයිතරම් ආදරය කළා ද කිව්වොත් ඒ අයත් එක්කයි විවාහ වෙන්න ඉන්නේ කියලත් කිව්ව අවස්ථා තිබුණා. ඒ වෙලාවට නම් මට ටිකක් බයත් හිතුණා. ඒ නාමල් කියන්නේ ජනප්‍රිය කෙනෙක් නිසා වෙනස් වේවිද කියලත්. සමහර වෙලාවට ඒ ගැන නාමල්ගෙන් ඇසුවත් නාමල් දෙන පිළිතුර ඊටත් වඩා මාව බය කරනවා. ඔහු ඒ දෙන පිළිතුර ඒ තරම්ම වගකීමකින් නොවෙයි කියන්නේ කියලා මට දැනෙනවා. ඒ සමහර අවස්ථාවල මම තනියෙන් ඇඬුව අවස්ථා ඕනෑ තරම්. නාමල් එක්ක තරහ වුණු අවස්ථාත් ඒ වගේමයි.

### නාමල්ගේ ජනප්‍රියත්වය ඔය දෙන්නා අතර දුරස්තභාවයකට හේතුවක් වුණා ද?

සමහර වෙලාවට මෙහෙම සිතුණා. නාමල් විදේශ ගත වුණාට පස්සේ ගොඩක් කාලයක් ඉන්නවා. ඒ නිසා ඔහුට මාව අමතක වේද කියන දුකක් මගේ සිතේ තිබුණා. කවුරු හරි සිත වෙනස් කරයි ද කියන සිතුවිල්ලත් මගේ සිතේ වැඩ කළා. ඒත් ටික දවසක් යන විට ඒ අදහස ආයෙත් වෙනස් වෙනවා.

### මේ ජීවිතයට රුවන්ති පුරුදු වුණේ කොහොම ද?

ඒ අවස්ථාවලදී මම කොහොම හරි ටිකෙන් ටික ඉවසන්න පුරුදු වුණා. විවාහයෙන් පස්සේ මුලින්ම නාමල් ප්‍රසංගවලට ගිහින් සති ගණන් ඈත ඉන්න අවස්ථා තිබෙනවා. ඒ අවස්තාවල මට ඇතිවෙන දුක මේ යැයි කියලා කියන්න බැහැ. දුව ලැබෙන්න ඉන්න කොට වුණත් මට ක්ලිනික් යන්න වුණේ නාමල් නැතුවයි. එතැනට ඇවිත් සිටි අනෙක් බිරින්දෑවරුන් දැක්කට පස්සේ මගේ සිතට ඇතිවුණේ දුකක්. ඒ ඔවුන් ඇවිත් සිටියේ තමන්ගේ සැමියාත් සමඟ වීම නිසයි. ඒ අවස්ථාවේ නාමල් මාත් සමඟ නොආවේ ඒ වනවිට ඔහු සිටියේ විදේශ ගතවෙලා. ඒ වගේ දේවල් රැසකට මට විවාහ දිවියෙන් පස්සේ මුහුණ දෙන්නට සිදුවුණා. ඒ සියලු දේ සඳහා මම මුහුණ දුන්නේ ගොඩක් ඉවසීමෙන්. ඒ වගේ ම කැපවීමෙන්. අද අපේ අයට විවාහයෙන් පස්සේ විවිධ දේ සිද්ධ වෙන්නේ තමන් තුළ තිබිය යුතු කැපවීම, ඉවසීම නැති නිසයි.

### ඔබගේ මේ ඉවසීම නැතිවෙලා ගිය අවස්ථාත් තිබුණා ද?

සමහර අවස්ථාවලදී එහෙම වුණු අවස්ථාත් තිබුණා. මොකද මම රහත් වුණු කෙනෙකු නොවෙයි. සමහර අවස්ථාවලදී මට තිබුණු කාර්යබහුලත්වය නිසාම තරහත් ගියා. ඒ වෙලාවලදී මම යකෙක් වගේ නාමල්ට බණින අවස්ථාත් නැතිවාම නොවෙයි. ඒ වෙලාවට කිසිම දෙයක් ඇහෙන්නේ නැතිව වගෙයි නාමල් සිටියේ. ඔහු ඒ කිසිම දෙයක් ගණනකට ගත්තේ නැහැ.

### නාමල්ගේ වැරැදි දැකලා ඒවාට බැනලත්, ඔහුට ආදරය කරන්න ඔබ පෙලඹුණා. නාමල්ට එහෙම කරන්න හේතුව විදියට ඔබට හැගුණේ මොනවගේ දේවල් ද?

ඇත්තටම සමහර වෙලාවට මට සිතුණ දෙයක් තමයි මම මුල ඉදලාම ඔහුට කිසිම වගකීමක් නොදුන් නිසා මෙහෙම වෙනවාද කියන එකත්. මම සියලු කටයුතු කරන නිසා ඔහු බොහොම සැහැල්ලුවෙන් නේ හැමදාකම සිටියේ. මේ වගේ හේතු ඒ සඳහා බලපෑව බවයි මට නම් සිතෙන්නේ.



### මේ නිසා කලාවට ආදරය කරන රසිකයන් කලාකරුවන්ගේ පවුල් පිළිබඳ සිතන්නේ විහිළුවක් විදියටයි. ඔබ ඒ අදහස ගැන මොකද කියන්නේ?

මේ කාරණයට බලපාන්නේ මම මීට පෙර කිව්ව කැපවීම හා ඉවසීම නැතිවීමයි. ඒ වගේම ඔය කියන ප්‍රශ්න සාමාන්‍ය ඒ රසිකයන්ගේ පවුල්වලටත් පොදුයි. ඒත් සමාජයේ කලාකරුවන් ජනප්‍රියයි. ඒ නිසා මේ ප්‍රශ්න ගැන කතා කරනවා වැඩියි.

මාෂා විස්වාශිනී